**37 වන පිටෙන්**

සිංහල ගීතයට ලැබුණු දායකත්වය ගැන සකච්චා කලෙමුඃ සුනිලුන් ලියූ ඬ සැන්දෑ කළුවර... මහා කන්ද ආදී ගීතවලට පාදක වූ වින්දන මූලයන් ගැන විමසා බැලූවෙමු.

එස් බී එස් ගුවන් විදුලියට අනුබද්ධ එන් අයි ටී වී නමැති රූපවාහිණී නාලිකාවක් ආරම්භ කළ දිනවලදී එස් බී එස් ගුවන් විදුලියේ සිංහල වැඩ සටහනකට සහභාගී වීමට ලැබීම සුනිලූන් ගේ මහත් සන්තුෂ්ටියට හේතුවිය. නොමිලයේ නැරඹිය හැකි එම නාලිකාව ආරම්භ කළේ ඔස්ට්‍රේලියානු ආදී වාසීන් වන ඇ බෝරිජින ජනතාව සිය හද බිම ලෙස සලකන උත්තර ප්‍රාන්තයේ උලූරු කඳු පාමුල සිට විසුරුවා හරින ලද සජීවී වැඩසටහනකිනි. එම වැඩ සටහන ගැන අදහස් දැක්වූ සුනිලූන් එස් බී එස් සිංහල අසන්නන් අමතා විස්තර කළේ ඔවුන් ශ්‍රී ලංකා රූපවාහිනීයේ ප්‍රධානියා ලෙස සේවය කළ 1994 වසරේදී වැදි නායක තිසාහාමිලැත්තන් ගේ පැල්පතේ සිට කළ සංවාදයක් දඹානේ සිට සජීවී ලෙස ශ්‍රී ලංකික ප්‍රේක්ෂකයන්ට නැරඹීමට අවස්ථාව සලසා දුන් ආකාරයයි.

සුනිල් සරත් පෙරේරා මහතා යනු ශ්‍රේෂ්ඨ කලාකාරයකු මේ යයි විදහා දක්වන ප්‍රතිමූර්තියකි. ඔහු කුඩා දරුවකු මෙන් අහිංසකයඃ නිහතමාන ය.ඔහුගේ ගී පද තුලින් පිලිබිඹු වන මානව දයාව, අව්‍යාජත්වය හා සොඳුරු බව ඔහු ඇසුරු කිරීමෙන් මට අවබෝධ විය.

සිඩ්නි නුවර ලේඛක සංසදයේ වැඩ මුළුව අවසන් වීමෙන් පසුව ගී පද රචනා විමර්ශන නමැති තම ග්‍රන්ථය ඔහු මට පරිත්‍යාග කළේයඃ තමා එළි දක්වන්නට අදහස් කරන මායා මාවත පොත ගැනත් එම පොතට පාදක වන දිනමිණ පුවත් පතේ බද්දර මල්ල තීරු ලිපි පෙළ ගැනත් මා සමග කතා බස් කළේයඃ එස් බී එස් ගුවන් විදුලියේ සිංහල අංශයේ පාවිච්චිය සඳහා ඔහුගේම ගී ඇතුලත් සංයුක්ත තැටි දෙකක් පරිත්‍යාග කළේයඃ වෙළඳ පොලට පිවිසී නොතිබුණු එම ගී තැටිවල අඩංගු ගීත නාම තම අත් අකුරෙන්ම අනුපිළිවෙලින් කඩදාසියක ලියා මට දුන්නේයඃ මියගිය තම ආදර බිරිඳ සරෝජිනී ගැන දයාර්ද ස්වරයෙන් කතා බස් කළේය. තමන් මීළගට පළ කරන පොත ඇයට පිළිගන්වන බව කියූ ඔහු ඒ නිමිත්තෙන් ලියූ කවි පෙළ මට පෙන්වා ම ළග තබාගන්න ලෙස කීවේ ය.

බිරිඳ වෙසින්
මා වෙත ආ දේවතාවියේ
අනියත නියත බව පෙන්වා
ඔබ මැකී ගියේ

ප්‍රබුද්ධ කලා කරුවකු සතු නිහතමානය , මානව දයාව හා සංවේදී බව සුනිල් සරත් පෙරේරා මහතාගේ ජීවිතය පුරාම පැතිර ඇති සත් ගුණ බව මට දැනිණ.

**20 වන පිටෙන්**

නෑ. ඉතින් එහෙනම් කොහොමද රහත් කියන්නේ ?.....

සමන්ත හිමියන් රහත්ද නැතිද කියන්න මට දැනුමක් නෑනෙ. ඇත්තටම ඒක කියන්න කාටවත් හැකියවාක් නෑ මං හිතන්නේ. නිර්වාණ අවබෝධය ගැන කියවලා තියන තරමින් මට හිතෙන විදිහට ඒක පුද්ගලයාට තමන් විසින් විඳිය හැකි දෙයක්. එය තමන් විසින් අවබෝධ කරගෙන තෘෂ්ණාව කියන සාධකය නැති කරගත් විට තමන් ඇතුලාන්තයෙන් අත් දකින දෙයක්.නමුත් ඒ දේ පිළිගන්න අපි ලෑස්ති නෑ. එකක්, අපිට කැමැත්තක් නෑ අපි ගත කරමින් ඉන්න සහ තව දුරටත් වර්ධනය කරගන්න ආසාවෙන් ඉන්න මේ පරිභෝජනවාදී ක්‍රමයට මද විරාමයක් හෝ දෙන්න. දෙක, අපි කැමති නෑ විශ්වාස කරන්න කවද හෝ අනාගත භවයක අපි රහත් උන දවසක අපිට ලැබෙන්නේ super powers නැති inner peace විතරක් තියන තත්වයක් කියන එක. ප්ලේන්ටියක් බොන්න ගියත් සෙල්ෆියක් ගහල fb දාලා "මම ප්ලේන්ටී බොනවෝ ,feeling පට්ට" කියලා දාන, පන්සලකට ගියත් තමන් කරපු දේවල් ලෝකෙට පේන්න photos ගහලා, තැන් තැන්වල කියවලා වපුරවන, සංස්කෘතික ප්‍රදර්ශනකාමයක් දක්වා පරිණාමය උන අපිට පිළිගන්න බෑ රහත් බව කියන්නේ ලෝකෙට පේන්න පොඩි වැඩ කෑල්ලක්වත් දාන්න බැරි තත්වයක් කියලා.

සමන්ත හඳු සාධකය කියන්නේ මෙන්න මේ fantasy නිර්වාණයෙන් අපිව මුදව ගන්නා ක්‍රියාවලියට. සැබවින්ම ඔහු රහත්ද නැතිද යන්න අපිට අදාල නෑ. වැදගත් වෙන්නේ ඔහු විසින් නිරූවත් කරන fantasy ගත ආගමික අධිපතිවාදය. ඔහුගේ ක්‍රියාවලිය හරහා අපිට පේන්න ගන්නවා අපි මෙතෙක් කලක් බුදු හාමුදුරුවන් ගැන පවා එලඹිලා ඉඳලා තියෙන්නේ සාහිත්‍ය කරුවන් මැවූ සුරංගනා කතා ලෝකයක කියලා. ඔයාට ඇයි මෙච්චර ලොකු පන්සලක් ? ඇයි මෙච්චර සල්ලි වියදම් කරන්නේ කියල අහනකොට , ඔහු අපිට උදාහරණ ගේනවා ජේතවනාරාමයේ විශාලත්වය හා ඒ කාලේ දුන්නයි කියන කහවණු කෝටි ගනනක දාන මාන ගැන. බුදුන් වහන්සේ උදෙසා දීපු ඒ ලොකු ලොකු පන්සල් , කහවණු ගණනක දාන මාන අපි මෙතෙක් කල් පාවිච්චි කලේ බුදුන්ගේ සහ රහතුන්ගේ වටිනාකම සහ අද්විතීය භාවය ගැන කියන්න පුලූවන් පම්පෝරියක් හැටියට.නමුත් ඔහු කියන දේ හරහා අපිට පේන්න ගන්නවා සාහිත්‍ය විසින් අපිව කොයි තරම් අන්දලාද කියලා. ඒ ඇන්දීමේ එලයක් හැටියට තමයි අපේ මිනිස්සු දහම් පාසලෙන් පටන්ගත් ජාතක කතා පොතේ ලස්සන කතා සාධු සාධු කිය කිය මැරිල යනකල්ම කියවන්නේ.ඊට එහා විනිවිද යන කියවීකට සූදානමක් කවදාවත් නෑ.දේවවාදී ආගම් සමග තිබුණු නිල නොලත් අරගලයන් වල සහ බුද්ධාලම්බන ප්‍රීතිය වැඩිදියුණු කිරීමේ අරමුණු වල ප්‍රතිඵල ලෙස බිහිවූ මේ සාහිත්‍ය නිර්මාණ අපිව කෙතරම් සැබෑ බුද්ධ දේශනාවෙන් ඈත් කරලද කියන එක වටහාගන්න සමන්ත හඳු සාධකය ඉතා වැදගත්. නමුත් කණගාටුවට කරුණ වෙනේ ඔහුගේ අනුගාමිකයන් ඔහුගේ මග පෙන්වීම යටතේ fantasyගත බෞද්ධ අධිපති රාමුවෙන් මිදෙනකොටම ඔවුන් ගිහිල්ලා සමින්තහඳුගේ රාමුවට ඇලෙනවා. තඩි තඩි බුදු පිළිම, දේව පිළිම, පළතුරු පූජාවෙන් මිදෙන ඔවුන් නතර වෙන්නේ සමන්ත හඳුගේ තඩි පිළිමයක් හදලා ඒකට පාට පාට මල් පූජා පවත්වන තැනකින්. සමන්ත හිමියන්ගේ ඇතැම් අනුගාමිකයන් face-book හරහා ඔහුට කඩේ යන්නේ දේශපාලකයන්ට කඩේ යන ටොයියොන්ට බයියොන්ට හා ජෙප්පොන්ටත් අන්ත විදිහට. බහුතරයක් එහෙම නොවේවායි අපි ප්‍රාර්තනා කරමු..... කරුණු එසේ වුවත් **මේ වෙසක් කාලය විචක්ෂණශීලීව දහම නැවත කියවීමකට හොඳ කාලයක්. ඉතින් වැඳිල්ල පැත්තකින් තියල කස්ටියත් එක්ක පොත පත පොඩ්ඩක් කියවන්න ගමු.**

http://naiyageni.blogspot.com.au


# SRI LANKAN RESTAURANT & TAKE AWAY BUSINESS FOR SALE

## MELBOURNE WEST

**Well established Sri Lankan restaurant with regular client base and excellent opportunity for improvement is on sale in Melbourne West. Here are some of the benefits of buying this business:**

- Excellent Foot Traffic in premier west of Melbourne close to city and public transport.
- Based in Main shopping strip of restaurants and cafés Suitable for breakfast, lunch, dinner and catering sales
- 70 seater with room for more
- Room for private functions
- All new kitchen equipments with the capacity for out door catering
- Excellent interior
- Plenty of car parking facilities

**Restaurant would suit an owner who is looking to genuinely run a profitable business with aspirations to make it bigger.**

**Please contact: 0432 029 792**

## FOR ALL YOUR TRANSLATIONS

PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

( ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
**DR. PREMA KUDALIGAMA**
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com